# ෆේස් බුක් භාවිතයේදි අනුගමනය කළ යුතු ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳ පරිශීලකයන් දැනුවත්ද යන්න විමර්ශනය

**එම්. එම්. එස්.පී මනම්පේරි** [1]

**දිනිති ජයසේකර** [2]

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

## සංක්ෂේපය

20 වන සියවසේ අවසාන භාගයේදී නව මාධ්‍ය පිළිබඳ අධ්‍යයනය කේන්ද්‍රීය කතිකාවක් බවට පත්විය. නව මාධ්‍යයක් ලෙස සමාජ ජාල හා වෙබ් අඩවි රැසක් හඳුනාගත හැක. සමාජ ජාලා අතරින් ෆේස් බුක් සමාජ ජාලය ලෝකයේ අතිවිශාල පරිශීලක පිරිසකගෙන් සමන්විත වූවකි. Alexa ශ්‍රේණිගත කිරීමට අනුව ලංකාවේ පළමු ස්ථානයේ රැඳී සිටින වෙබ් අඩවිය වන්නේ ෆේස් බුක් සමාජ ජාලයයි. නමුත් ශ්‍රී ලංකා පරිගනක හදිසි ප්‍රතිචාර සංසදය මඟින් වාර්ෂිකව ඉදිරිපත් කර ඇති ෆේස් බුක් සම්බන්ධ පැමිණිලි වාර්තා විමසා බැලීමේදී පැහැදිලි වන්නේ ෆේස් බුක් අවභාවිතයෙහි ශීඝ්‍ර වර්ධනයක් සිදුවෙමින් පවතනි බවයි. ඒ අනුව මෙම සමීක්ෂණයේදී ෆේස් බුක් භාවිතයේදී අනුගමනය කළ යුතු ආරක්ෂක ක්‍රම පිළිබඳ පරිශීලකයන්ගේ දැනුවත් භාවය කෙබඳුදැයි සබරගමු පළාතට විශේෂිතව අධ්‍යයනයක් සිදු කරන ලදී. පරිශීලකයන් අනවබෝධයෙන් සිදුකරන ක්‍රියා මඟින් ඔවුන්ගේ පෞද්ගලිකත්වයට හා ආරක්ෂාවට තර්ජන එල්ල වේ. මෙම පර්යේෂණයේදී ෆේස් බුක් භාවිතයේදී අනුගමනය කළ හැකි ආරක්ෂක ක්‍රමෝපාය පිළිබඳ පරිශීලකයන් දැනුවත්ද, ෆේස් බුක් අවභාවිතයක් සිදුවුවහොත් ගතයුතු ක්‍රියා මාර්ග මොනවාද, පරිශීලකයන් ෆේස් බුක් භාවිත කිරීමේ අරමුණු මොනවාද, යන්න අධ්‍යයනය කරන ලදී. මේ සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද ද්විත්වයම භාවිත කර තිබේ. නව මාධ්‍ය හා තොරතුරු සන්නිවේදනය පිළිබඳ විශේෂඥයින්, රාජ්‍ය හා පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ බලධාරීන්, නෛතික ව්‍යූහය පිළිබඳ දැනුමින් යුත් ප්‍රවීණයන් මෙහිදී සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන ලද අතර ෆේස් බුක් අවභාවිතය හා සම්බන්ධ සිද්ධි අධ්‍යයනයක්ද සිදු කර ඇත. මීට අදාළ අන්තර්ජාල හා පුවත්පත් ලිපි ආදීය පරිශීලනය කිරීමෙන් පර්යේෂණයට අවශ්‍ය තොරතුරු රැස්කර ගැනුණි. ප්‍රමාණාත්මක දතත් රැස්කිරීමේදී ප්‍රශ්නාවලී ක්‍රමය භාවිත කර පරිශීලකයන් ෆේස් බුක් භාවිතයේදී ආරක්ෂක හා තාක්ෂණික උපදෙස් පිළිබඳ දැනුවත්ද යන්න විමසා බැලීමක් සිදු කෙරිණි.

ෆේස් බුක් සම්බන්ධව නෛතික ක්‍රමවේදයක් මේ වනතුරුත් ලංකාව සතුව නැත. නමුත් සංඛ්‍යාත්මක දත්ත අනුව ෆේස් බුක් සම්බන්ධ පැමිණිලි දිනෙන් දිනම වර්ධනය වේ. මෙම පර්යේෂණය අවසානයේ එළඹිය හැකි නිගමනය වන්නේ පරිශීලකයන්ට ෆේස් බුක් භාවිතයේදී අනුගමනය කළ හැකි ආරක්ෂක ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් නැත යන්නයි . එබැවින් ෆේස් බුක් භාවිතයේ දී අනුගමනය කළ යුතු ආරක්ෂක ක්‍රම පිළිබඳ වගකිවයුතු ආයතන මඟින් පරිශීලකයන්ට පුළුල් දැනුවත් කිරීමක් සිදු කළ යුතු බව යෝජනා කළ හැක.

*1. ජනසන්නිවේදනය, ජනසන්නිවේදනය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. කථිකාචාර්ය, ජනසන්නිවේදනය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*